# ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පළාත
பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்
## Chief Secretary's Office – North Western Province
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල மாகாண சபை அலுவலகத் தொகுதி, குருணாகல் Provincial Council Office Complex, Kurunegala
ආයතන හා පරිපාලන අංශය தாபனமும் நிர்வாக பிரிவு Establishment and Administration Division


මගේ අංකය / எமது இலக்கம் / My No } NWP/CS/AD/23/15 iii වෙළුම

ඔබේ අංකය / உமது இலக்கம் / Your No }

දිනය / திகதி / Date } 2020.11.26

……………………………….

……………………………….

……………………………….

**වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් වාහනවලට 2021.12.31 දක්වා කාලය සඳහා පූර්ණ රක්ෂණාවරණය ලබාගැනීම.**

වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයට අයත් සියලුම වාහන රක්ෂණ අලුත් කිරීම එකම දිනයකට ගැනීම සඳහා තීරණය කර ඇත.

02. ඒ අනුව ඇමුණුම් අංක 01 සඳහන් එක් එක් වාහනයක තක්සේරු වටිනාකමට අනුව එම වාහනවල පූර්ණ රක්ෂණාවරණය පහත අමතර ආවරණයන් ද සහිතව 2021.12.31 දක්වා කාලය සඳහා සැපයීමට ඔබ ආයතනයේ මිළ ගණන් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

I. ජල ගැලීම් ආවරණය / ස්වභාවික විපත් ආවරණය
II. පුද්ගල හදිසි අනතුරු ප්‍රතිලාභ
III. විශේෂ වින්ඩ්ස්ක්‍රීන් ආවරණය (හානියකදී 100% ආවරණය වන පරිදි)
IV. එයාර් බෑග් අතිරේක ආවරණය (හානියකදී 100% ආවරණය වන පරිදි)
V. කම්කරු වන්දි ආවරණය (රියදුරු)
VI. අසීමිත තුන්වන පක්ෂ ආවරණය (ජීවිත හා දේපළ හානියකදී 100% ආවරණය වන පරිදි)
VII. කැරලි කෝලහල හා සිවිල් සංඝට්ටන ආවරණය
VIII. ත්‍රස්ථවාදී ආවරණය

03. ඔබ විසින් රක්ෂණ වන්දිය සපයන ක්‍රමවේදය හා ඊට ගතවන කාලයද සහිතව පූර්ණ රක්ෂණාවරණය ඉහත අමතර ආවරණයක් ද සමග සපයන බවටද තහවුරු කෙරෙන ලිපියක් සමඟින් වියදම් ඇස්තමේන්තුව සකස් කොට 2020.12.09 දින ප.ව 2.00 වන විට හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන ලේකම් කාර්යාලයේ සැපයුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වමි.

04. තවද 2020.12.09 දින ප.ව 2.00 ට ටෙන්ඩර් පෙට්ටිය විවෘත කිරීමේ අවස්ථාවට හා 2020.12.09 දින ප්‍රසම්පාදන මණ්ඩලය ඔබ විසින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් විවෘත කරනු ලබන අවස්ථාවට ඔබ ආයතනයේ නියෝජිතයෙකුට අනන්‍යතාවය තහවුරු කොට සහභාගී වීමට පහසුකම් සලසා ඇති බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ඊ.එම්.පි. ඒකනායක
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පරිපාලන)
වයඹ ප්‍රධාන ලේකම් වෙනුවට.

පිටපත - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) - ටෙන්ඩර් පෙට්ටියට මිළ ගණන් බහාලීමට අවශ්‍ය කටයුතු සලසා දීමට

E:\AD_23\වෙනත් ගොනු\වාහන රක්ෂණය කිරීම\23-15-057.docx